# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,442 - 2025 ජූනි මස 20 වැනි සිකුරාදා - 2025.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1066 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1085 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජූලි මස 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජූනි මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ.බ.).

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1063- B 082692 — 5,403 (2025/06)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලීසිය

### උප පොලිස් පරීක්ෂක (පිරිමි) තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික උප පොලිස් පරීක්ෂක (පිරිමි) තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් **2025.07.21** වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

තනතුරෙ හි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ.

03. වැටුප් ක්‍රමය - (මාසිකව)

රු. 55,410 - 7 x 670 - 2 x 890 - 25 x 1,190- රු.91,630.00.

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. 10/2025 අනුව සිදු කර ඇත.

තව ද, මෙම නිලධාරීන් 2022.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා පොලීසියේ නිවේදන CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු.17,800.00 |
| (ආ) | රා.ප.ච. 10/2025 අනුව ගෙවනු ලබන විශේෂ දීමනාව (මූලික වැටුපෙන් 22% ක් සමග රු. 1250.00) | |
| (ඇ) | දුෂ්කර දීමනාව | රු. 2,000.00 |
| (ඈ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | රු. 31,800.00 |
| (ඊ) | සේවා කාලය අනුව වෙනත් දීමනා | |

මෙම දීමනාවලට අමතරව -

(අ) ප්‍රවාහන පහසුකම්,
(ආ) නිලධාරීන්ට සුභසාධන වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර ගැනීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.),
(ඇ) නිල ඇඳුම්
(ඈ) සුදුසුකම් සපුරන නිලධාරීන්ට රාජ්‍ය විශ්වවිද්‍යාල, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ආයතන මඟින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමි වේ,
(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යා හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්,
(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් දීමනා, දුෂ්කර දීමනා හා විශිෂ්ඨ රාජකාරී සඳහා තෑගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. අවශ්‍ය මූලික සුදුසුකම් :

4:1 වයස් සීමාව :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-26 ත් අතර විය යුතුය. එසේ වුව ද දැනට ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 28 දක්වා අයදුම්කළ හැක.

4:2 අධ්‍යාපන සුදුසුකම් :
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් මාධ්‍ය භාෂාව සහ ගණිතය විෂයයන් ඇතුලුව සම්මාන සාමාර්ථ 04 ක් සහිත ව එක් වරක දී විෂයන් 06 ක් සමත්වීම ;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් එක් වරක දී විෂයයන් 03 කින් සමත් වී තිබිය යුතු ය. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර).

**සටහන 01** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41:44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙස ද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**සටහන 02** අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

**සටහන 03** වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා/පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

4:3 කායික සුදුසුකම් :

- උස අඩි 05 අඟල් 06 හෝ ඊට වැඩි විය යුතුයි.(සෙන්ටිමීටර් 167.64)
- පපුව අඟල් 32 හෝ ඊට වැඩි විය යුතුයි.(සෙන්ටිමීටර් 81.28) හුස්ම නාල්ලා

4:3:1 සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4:3:2 දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් -උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතු ය, එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතු ය.

4:3:3 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරීවලට බාධා විය හැකි අන්දමේ කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතු ය.

4:4 වෙනත් සුදුසුකම් :

4:4:1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

4:4:2 අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

4:4:3 අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන්, වැන්දඹුවන්, සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි)

4:4:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4:4:5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍යවන 4:1 සහ 4:2 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර, 4:4 හි සුදුසුකම් බඳවා ගන්නා දිනට ද ඒ ආකාරයෙන් ම තිබිය යුතු ය.

05. මූලික පරීක්ෂණය :

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේ දී ඉහත ඡේද 4:1, 4:2 හා 4:3 (4:3:1 හා 4:3:2 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පතිවරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඔරොත්තු දීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. අයදුම්කරුවන් විසින් ඔරොත්තු දීමේ පරීක්ෂණයට මුහුණ දීමට සුදුසු බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයකුගේ නිර්දේශය සහිත ව එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

| *ක්‍රියාකාරකම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| දුර දිවීමේ මීටර්/ Run meters 1000 | විනාඩි 03ට අඩුනම් | 30 |
| | විනාඩි 03ත් 04ත් අතර | 20 |
| | විනාඩි 04ත් 05ත් අතර | 10 |
| Chinup (වාර 05ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Situp (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Squat Thrust (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි, ධාරණය කර ගැනීමට තත්පර 30යි, ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 යි |

සටහන : මීටර් 1,000 ක දුරක් විනාඩි 05 ක කාලයක දී දිවීමට අසමත්වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

06. ලිඛිත විභාගය :

මූලික පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ලිඛිත විභාගය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | කාලය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 40 | වි. 45 | 40% |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 60 | පැය 01 | |

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

මූලික පරීක්ෂණයෙන් හා ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පතිවරයා විසින් පත් කරනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ. |
| 02. භාෂා දැනුම | 10 | |
| 03. පරිගණක හැකියාව/වෙනත් | 10 | |
| 04. ක්‍රීඩා කුසලතාවය | 20 | |
| 05. නායකත්වය/ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 20 | |
| එකතුව | 100 | |

08. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත විභාගයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කරනු ලැබේ. එම ලකුණු අනු පිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 125 % ක අයදුම්කරුවන් ගණනක් පසුබිම් පරීක්ෂණය සහ වෛද්‍ය පරීක්ෂණයට කැඳවා ඉන් සමත්වන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරට බඳවා ගනු ලැබේ.

*සටහන* : ඉහත පටිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ඨ ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්ත වූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවෙකුගේ උස සහ පපුව පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධාරියාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.

09. පසුබිම් පරීක්ෂණය :

9:1 ලිඛිත පරීක්ෂණයෙන් හා ව්‍යුහගත පරීක්ෂණයෙන් අයදුම්කරුවන් ලබා ගත් ලකුණු සංඛ්‍යාවේ එකතුව අවරෝහණ ක්‍රමයට සකස් කර එම ලකුණු අනුපිළිවෙල අනුව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත අයදුම්කරුවන් සම්බන්ධයෙන් අයහපත් වාර්තා පිළිබඳව පසුබිම් පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

9:2 මෙහිදී අයදුම්කරුගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන් ද ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේ ද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

9:3 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවක දී පත්වීම අවලංගු කිරීම හෝ සේවයෙන් පහ කිරීම සිදු කරනු ලැබේ.

*සටහන* : කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ වගන්ති 59 හි හා දැනට අනුමත බඳවා ගැනීම් පටිපාටියේ වගන්ති 7:2:4:5:2 හා පොලිස්පති චක්‍රලේඛ 2014/ 2007 හි සඳහන් කරුණුවලට අදාලව අසත්‍ය තොරතුරු සපයා පොලිස් සේවයට බැඳී ඇති බවට අනාවරණය වුවහොත් ඔබගේ පත්වීම අවලංගු කිරීම සම්බන්ධව ගනු ලබන තීරණයන්ට එකඟ විය යුතුය.

10. වෛද්‍ය පරීක්ෂණය :

යහපත් පසුබිම් වාර්තා ඇති අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා ඇතුලු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මෙහි දී අයදුම්කරුවන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකට ද යොමු කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. වෛද්‍ය පරීක්ෂණය සෞඛ්‍ය 169 පෝරමයට අදාළව සිදු කරනු ලබයි. වෛද්‍ය මණ්ඩලය ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්කරුවන්ට අභියාචනා ඉදිරිපත් කළ නොහැක.

11. පුහුණුව :

11:1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පොලිස්පතිවරයා විසින් නියම කරනු ලබන දිනක දී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ දී ලබාදෙන අතර, ඉන් පසුව ආධුනික කාලය අවසන්වන තෙක් අදාළ ක්ෂේත්‍ර පුහුණුව ලබා දීම සිදුකරනු ලැබේ.

11:2 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරින්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

12. තනතුරේ ස්වභාවය :

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතුය.)

13. සේවා කොන්දේසි :

13:1 තෝරා ගනු ලබන අයදුම්කරුවන් පහත 13:3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතුය.

13:2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

13:3 රාජ්‍ය සේවා කොමිෂන් සභා, ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් ගැසට් නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, පොලිස් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

13:4 ආධුනික කාලය පත්වීම් දින සිට මුල් වසර 03 ක් සඳහා බල පැවැත්වෙන අතර, එම කාලය තුළ දී නිලධරයා හට විවාහ වීමට අවසර දෙනු නොලැබේ. විවාහ විය හැක්කේ පොලිස් චක්‍රලේඛ වලින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව පමණි. මෙම රෙගුලාසිය උල්ලංඝනය කළ හොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

13:5 බඳවා ගන්නා අයදුම්කරුවන් පුහුණුව අවසන් කිරීමෙන් පසු අවුරුදු 05 ක අනිවාර්ය සේවා කාලයක් සේවය කළ යුතුය. මෙම අනිවාර්ය සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධරයෙකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම්, ඔහුගේ පුහුණුව හා නිල ඇඳුම් ඇතුලු අනෙකුත් වියදම් වෙනුවෙන් නියම කරනු ලබන මුදල් සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමකට එළඹිය යුතුය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභා හා රාජ්‍ය සේවා කොමිෂන් සභා විධිවිධානයන්ට අනුව කටයුතු කරනු ලැබේ.

13:6 ඉදුරාම බඳවා ගන්නා සෑම නිලධරයෙකු ම පොලිස් සේවයට පළමුවෙන් පත් කරනු ලැබූ විට තමා සතු වූ ස්වකීය අයිතියෙන් ම ඇත්තාවූ හෝ නමට ලියා තිබෙන්නා වූ හෝ පවරා තිබෙන්නාවූ හෝ සියලුම වත්කම් පිළිබඳවද තමා විසින් දරනු ලැබූ සියලුම බැරකම් පිළිබඳව ද විස්තර සිය පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් කිරීම පිණිස (ප්‍රතිශෝධිත) අංක 261 දරන පොදු ආකෘති පත්‍රයේ ඇතුළත් කර පොලිස්පතිවරයා වෙත සැපයිය යුතුය.

නිලධරයා විවාහ වූ වහාම ඉහත කී විස්තරය කලත්‍රයා සම්බන්ධව ද ඇතුළත් කර සැපයිය යුතුය.

ඉහත විස්තර කර ඇති ආකාරයේ අලුත් අයිතිවාසිකමක් හෝ වත්කමක් හෝ අත්කර ගනු ලැබුවහොත් එසේ අත්කර ගන්නා ලද අයිතිවාසිකම හෝ වත්කම පිළිබඳව ද සම්පූර්ණ විස්තර තමාගේ පුද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් කිරීම සඳහා සෑම නිලධරයෙකු විසින් ම පොලිස්පති වෙත ලිඛිතව දැන්විය යුතුය.

13:7 ආධුනික උප පොලිස් පරීක්ෂක නිලධරයන් ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා දිවුරුම් දිය යුතුය.

14. පත්වීම ස්ථිර කිරීම :

ඉදුරාම බඳවා ගත් නිලධාරින් වසර 03 ක පරිවාස කාලය තුළ දී මාසිකව පවත්වනු ලබන ප්‍රගති ගොනුවක් මාස 33 ක් පවත්වා ගෙන යා යුතුය. පරිවාස කාලය අවසානයේ දී එම නිලධරයන්ගේ සේවය පත්කිරීම් බලධාරියා විසින් ස්ථිර කරනු ලැබේ. තවද, පරිවාස කාලය තුළ දී 01 වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත්වන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය 01 වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ගතවන අමතර කාලය මත කාර්ය පටිපාටික රීති අනුව තීරණය කර, පත්කිරීම් බලධාරියා විසින් සේවය ස්ථිර කරනු ලබයි.

එසේ වුවද ඉදුරාම බඳවා ගනු ලබන, අමතර වසර 03 ක කාලයක් ඇතුළත 01 වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත් වන නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීම හෝ පරිවාස කාලය දීර්ඝ කිරීම සම්බන්ධව පත්කිරීම් බලධාරියා විසින් තීරණය කළහොත් මිස පත්වීම අවසන් කරනු ලැබේ.

15. කාර්යක්ෂමතා කඩඉම :

කාර්යක්ෂමතා කඩඉම ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ.

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තිය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ (සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය) | උප පොලිස් පරීක්ෂක තනතුරට පත් වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත, ප්‍රායෝගික හා වාචික |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් පරීක්ෂක තනතුරට පත් වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට පත් වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩ ගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |

16. භාෂා ප්‍රවීණතාව :

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍ර ලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය. |
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |

17. මෙම *ගැසට්* පත්‍රයේ I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි බලපානු ඇත.

18. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපිලේඛන වල පිටපත් අයදුම්පත්වලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතුය.)

(*අ*) උප්පැන්න සහතිකය ;

(*ආ*) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්;

(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික.

19. (*අ*) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(*ආ*) අයදුම්කරු විසින් අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත්අකුරුවලින් ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පුද්ගලිකව භාර නොදිය යුතුය.

20. මෙම නිවේදනයෙ හි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින් ම සනාථ නොකරන අයදුම්පත් හා ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි ආකෘතියට පරිබාහිරව යොමු කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර එබඳු අයදුම්කරුවන් හට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන* - පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

ප්‍රියන්ත වීරසූරිය,
*වැඩබලන පොලිස්පති.*

**ශ්‍රී ලංකා පොලිසිය**

ආධුනික උප පොලිස් පරීක්ෂක තනතුර

**ආදර්ශ අයදුම්පත්‍රය**

මෙහි 2 x 2 ½ ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් අමුණා එවිය යුතුය.

01. (i) (අ) සම්පූර්ණ නම (සිංහල/දෙමළ) :

.....................................................................................................................................................

(උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය)

(ආ) මුලකුරු සමග නම (සිංහල/දෙමළ) :

.....................................................................................................................................................

(ii) (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(ආ) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

02. ජාතික හැඳුනුම්පත් අංකය : ............................................................ (ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය)

03. පියාගේ සම්පූර්ණ නම : ............................................................

04. අයදුම්කරු උපන් ස්ථානය : ............................................................

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .......................... පළාත : ..........................

05. (i) වර්තමාන ලිපිනය (සිංහල/දෙමළ) :

.....................................................................................................................................................

(අ) වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් වසම : ............................................................

(ii) ස්ථිර ලිපිනය (සිංහල/දෙමළ) : ............................................................

(අ) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් වසම : ............................................................

(ඇ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම : ............................................................

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ............................................................

(ඈ) ලිපි හුවමාරු කළ යුතු ලිපිනය : ............................................................

(උ) දුරකතන අංකය : නිවස : .................................................... ජංගම : ...................................................

වට්ස්ඇප් අංකය : ...............................

(ඌ) විද්‍යුත් තැපැල් ලිපිනය : ...................................................

06. ජන වර්ගය : ..........................................................

07. උපන් දිනය : ..........................................................
(උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුයි)

වයස : (*ගැසට්* නිවේදනයට අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු : ............................ මාස : ............................ දින : ............................

08. (අ) උස :- අඩි : ............................ අඟල් : ............................ (ආ) පපුව : අඟල් : ............................

උස :- සෙන්ටිමීටර් : ............................ පපුව :- සෙන්ටිමීටර් : ............................

09. අධ්‍යාපන සුදුසුකම්-(සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය)

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය : ............................

විභාග අංකය : ............................

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය : ............................

විභාග අංකය : ............................

| *විෂය ධාරාව* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| Z Score අගය | | |

(ආ) හදාරා ඇති/හදාරමින් සිටින උපාධි :

| *උපාධිය* | *විශ්වවිද්‍යාලය* | *උපාධිය හදාරා ඇත්ද/ හදාරමින් සිටීද යන වග* |
|---|---|---|
| | | |
| | | |

10. ලිඛිත පරීක්ෂණය සඳහා සුදුසුකම් ලදහොත් පෙනී සිටින මාධ්‍යය : ....................................

11. විවාහක/අවිවාහක බව : ....................................

12. දැනට ඔබ කරන රැකියාව : ....................................

13. ඔබ දැනට ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන්නේද ? : ....................................

එසේ නම් නිලය හා නිල අංකය : ....................................

රාජකාරී ස්ථානය : .................................... කොට්ඨාසය : ....................................

14. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිසියේ, සේවය කර තිබේද? : ....................................

එසේ නම් තනතුර සහ නිල අංකය : ....................................

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න

..............................................................................................................................................................

15. (අ) ඔබ සන්නද්ධ සේවයක/ සන්නද්ධ ස්වේච්ඡා සේවයක සේවය කරන්නේද? එසේ නම් නිලය හා නිල අංකය .................... (අයදුම්පත අදාළ ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.)

(ආ) ඔබ සන්නද්ධ සේවාවක/ සන්නද්ධ ස්වේච්ඡා සේවයක සේවය කර ඇත්ද? එසේ නම් සේවයේ යෙදී සිටිය දී අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. නැතහොත් ඔබ සන්නද්ධ සේවාවක සේවය හැර ගොස් හෝ දඬුවම් ලැබ ඇත්නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න .......................................

16. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද? ...................................... එසේම යම් වරදක්(අපරාධ වැරදි/ නින්දනීය වැරදි/ දූෂණ වැරදි) සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබූ හෝ දඬුවම් ලැබ හෝ දඬුවම් වශයෙන් රජයේ ගාස්තුවකට යටත් කර හෝ ඇත්ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න) ............................

17. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් (අපරාධ වැරදි/ නින්දනීය වැරදි/ දූෂණ වැරදි) සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද? නැතහොත් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ රජයේ ගාස්තුවකට යටත් කර ඇත්ද? එසේ නම් විස්තර සඳහන් කරන්න.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු අසත්‍ය තොරතුරු බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවකදී පත්වීම අවලංගු වන බව හා සේවයෙන් පහකිරීමට යටත් වන බව දනිමි.

.....................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : .....................................

18. *ආයතන ප්‍රධානියාගේ සහතිකය (අදාළ නම් පමණි.)* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................................... මහතා .................................. ................................................................................................ දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

.....................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර : .....................................

දිනය : .....................................

06-112/1

---

**ශ්‍රී ලංකා පොලීසිය**

පොලිස් කොස්තාපල් (පිරිමි) තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් (පිරිමි) තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2025.07.21 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

අයදුම්පත් ලැබෙන අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

තනතුරෙ හි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ.

03. *වැටුප් ක්‍රමය - (මාසිකව)*

රු. 49,550 - 7 x 540 - 670 x 27 -රු. 71,420.00

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. 10/2025 අනුව සිදු කර ඇත.

තව ද, මෙම නිලධාරින් 2022.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා පොලීසියේ නිවේදන CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු.17,800.00 |
| (ආ) | රා.ප.ච. 10/2025 අනුව ගෙවනු ලබන විශේෂ දීමනාව (මූලික වැටුපෙන් 22% ක් සමග | රු. 1250.00 |
| (ඇ) | දුෂ්කර දීමනාව | රු. 2,000.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනා | රු. 28,800.00 |
| (ඊ) | සේවා කාලය අනුව වෙනත් දීමනා | |

මෙම දීමනාවලට අමතරව -

(අ) ප්‍රවාහන පහසුකම් :
(ආ) නිලධාරීන්ට සුභසාධන වෛද්‍ය පහසුකම් : (විදේශ රටක දී වුවද ප්‍රතිකාර ගැනීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
(ඇ) නිල ඇඳුම් :
(ඇ) සුදුසුකම් සපුරන නිලධාරින්ට රාජ්‍ය විශ්වවිද්‍යාල, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමි වේ :
(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම් :
(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් දීමනා, දුෂ්කර දීමනා හා විශිෂ්ඨ රාජකාරි සඳහා තෑගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

4:1 *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතුය.

4:2 *අධ්‍යාපන සුදුසුකම්* :
අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් මාධ්‍ය භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව අපේක්ෂකයෙකු එකවර විෂයයන් 06කින් සමත් විය යුතු අතර, සම්මාන සාමාර්ථ 04ක් තිබිය යුතුය ; සහ ගණිතය විෂය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්විය යුතුය.

***සටහන 01*** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41:44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙස ද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

***සටහන 02*** අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

***සටහන 03*** වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා/පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

4:3 *කායික සුදුසුකම්* :

- උස අඩි 05 අඟල් 04 හෝ ඊට වැඩි විය යුතුයි.(සෙන්ටිමීටර් 162.5)
- පපුව අඟල් 30 හෝ ඊට වැඩි විය යුතුයි.(සෙන්ටිමීටර් 76) හුස්ම නාල්ලා

4:3:1 සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4:3:2 දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්.-උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතුය. එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතුය.

4:3:3 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරීවලට බාධා විය හැකි අන්දමේ කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.

4:4 වෙනත් සුදුසුකම් :

4:4:1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

4:4:2 අයදුම්කරු අයහපත් චරිතයකින් යුක්ත නො විය යුතුය.

4:4:3 අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන්, වැන්දඹුවන් සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි)

4:4:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

4:4:5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍යවන 4:1 සහ 4:2 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:4 හි සුදුසුකම් බඳවා ගන්නා දිනට ද ඒ ආකාරයෙන් ම තිබිය යුතුය.

05. මූලික පරීක්ෂණය :

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේ දී ඉහත ඡේද 4:1, 4:2 හා 4:3 (4:3:1 හා 4:3:2 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඔරොත්තු දීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අයදුම්කරුවන් විසින් ඔරොත්තු දීමේ පරීක්ෂණයට මුහුණ දීමට සුදුසු බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිත ව එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

| *ක්‍රියාකාරකම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| දුර දිවීම මීටර්/ Run meters 1,000 | විනාඩි 03ට අඩු නම් | 30 |
| | විනාඩි 03ත් 04ත් අතර | 20 |
| | විනාඩි 04ත් 05ත් අතර | 10 |
| Chinup (වාර 05ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Situp (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Squat Thrust (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි. ධාරණය කර ගැනීමට තත්පර 30යි. ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 කි |

*සටහන* : මීටර් 1,000 ක දුරක් විනාඩි 05 ක කාලයකදී දිවීමට අසමත්වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

06. ලිඛිත විභාගය :

මූලික පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ලිඛිත විභාගය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගය පහත විෂයයන් යටතේ පවත්වනු ලැබේ. :-

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 50 | 40% |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 50 | |

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

මූලික පරීක්ෂණයෙන් හා ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත් කරනු ලැබේ.

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 02. වෘත්තිය සුදුසුකම් | 15 | |
| 03. භාෂා හැකියාව | 10 | |
| 04. ක්‍රීඩා කුසලතාවය | 20 | |
| 05. නායකත්වය/ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 20 | |
| එකතුව | 100 | |

08. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත විභාගයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කරනු ලැබේ. එම ලකුණු අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 125 % ක අයදුම්කරුවන් ගණනක් පසුබිම් පරීක්ෂණ සහ වෛද්‍ය පරීක්ෂණයට කැඳවා ඉන් සමත්වන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරට බඳවා ගනු ලැබේ.

*සටහන* .- ඉහත පටිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්ත වූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවෙකුගේ උස සහ පපුව පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධාරියාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.

09. පසුබිම් පරීක්ෂණය :

9:1 ලිඛිත පරීක්ෂණයෙන් හා ව්‍යුහගත පරීක්ෂණයෙන් අයදුම්කරුවන් ලබා ගත් ලකුණු සංඛ්‍යාවේ එකතුව අවරෝහණ ක්‍රමයට සකස් කර එම ලකුණු අනුපිළිවෙළ අනුව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත අයදුම්කරුවන් සම්බන්ධයෙන් අයහපත් වාර්තා පිළිබඳව පසුබිම් පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

9:2 මෙහිදී අයදුම්කරුගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන් ද, ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේ ද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

9:3 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවක දී පත්වීම අවලංගු කිරීම හෝ සේවයෙන් පහකිරීම සිදු කරනු ලැබේ.

*සටහන* .- කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ වගන්ති 59 හි හා දැනට අනුමත බඳවා ගැනීම් පටිපාටියේ වගන්ති 7:2:4:5:2 හා පොලිස්පති චක්‍රලේඛ 2014/ 2007 හි සඳහන් කරුණුවලට අදාලව අසත්‍ය තොරතුරු සපයා පොලිස් සේවයට බැඳී ඇති බවට අනාවරණය වුවහොත් ඔබගේ පත්වීම අවලංගු කිරීම සම්බන්ධව ගනු ලබන තීරණයන්ට එකඟ විය යුතුය.

10. වෛද්‍ය පරීක්ෂණය :

අයහපත් පසුබිම් වාර්තා නොමැති අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා ඇතුළු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මෙහි දී අයදුම්කරුවන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකටද යොමු කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. වෛද්‍ය පරීක්ෂණය සෞඛ්‍ය 169 පෝරමයට අදාළව සිදු කරනු ලබයි. වෛද්‍ය මණ්ඩලය ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්කරුවන්ට අභියාචනා ඉදිරිපත් කළ නොහැක.

11. පුහුණුව :

11:1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පොලිස්පතිවරයා විසින් නියම කරනු ලබන දිනක දී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ ලබාදෙන අතර, ඉන් පසුව ආධුනික කාලය අවසන්වන තෙක් අදාළ ක්ෂේත්‍ර පුහුණුව ලබා දීම සිදුකරනු ලැබේ.

11:2 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරින්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම, පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

12. තනතුරේ ස්වභාවය :

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතුය.)

13. සේවා කොන්දේසි :

13:1 තෝරා ගනු ලබන අයදුම්කරුවන් පහත 13:3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතුය.

13:2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

13:3 රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් ගැසට් නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, පොලිස් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

13:4 ආධුනික කාලය පත්වීම් දින සිට මුල් වසර 03 ක් සඳහා බල පැවැත්වෙන අතර, එම කාලය තුළ දී නිලධරයා හට විවාහ වීමට අවසර දෙනු නොලැබේ. විවාහ විය හැක්කේ පොලිස් චක්‍රලේඛ වලින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව පමණි. මෙම රෙගුලාසිය උල්ලංඝනය කළහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

13:5 බඳවා ගන්නා අයදුම්කරුවන් පුහුණුව අවසන් කිරීමෙන් පසු අවුරුදු 05 ක අනිවාර්යය සේවා කාලයක් සේවය කළ යුතුය. මෙම අනිවාර්යය සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධරයෙකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම්, ඔහුගේ පුහුණුව හා නිල ඇඳුම් ඇතුළු අනෙකුත් වියදම් වෙනුවෙන් නියම කරනු ලබන මුදල් සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමකට එළඹිය යුතුය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභා හා රාජ්‍ය සේවා කොමිෂන් සභා විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

13:6 ඉදුරාම බඳවා ගන්නා සෑම නිලධරයෙකු ම පොලිස් සේවයට පළමුවෙන් පත් කරනු ලැබූ විට තමා සතු වූ ස්වකීය අයිතියෙන් ම ඇත්තාවූ හෝ නමට ලියා තිබෙන්නා වූ හෝ පවරා තිබෙන්නාවූ හෝ සියලුම වත්කම් පිළිබඳවද, තමා විසින් දරනු ලැබූ සියලුම බැරකම් පිළිබඳව ද විස්තර සිය පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් කිරීම පිණිස (ප්‍රතිශෝධිත) අංක 261 දරන

පොදු ආකෘති පත්‍රයේ ඇතුළත් කර පොලිස්පති වෙත සැපයිය යුතුය.

නිලධරයා විවාහ වූ වහාම ඉහත කී විස්තරය කලත්‍රයා සම්බන්ධව ද ඇතුළත් කර සැපයිය යුතුය.

ඉහත විස්තර කර ඇති ආකාරයේ අලුත් අයිතිවාසිකමක් හෝ වත්කමක් හෝ අත්කර ගනු ලැබුවහොත් එසේ අත්කර ගන්නා ලද අයිතිවාසිකම හෝ වත්කම පිළිබඳව ද සම්පූර්ණ විස්තර තමාගේ පුද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් කිරීම සඳහා සෑම නිලධරයෙකු විසින් ම පොලිස්පති වෙත ලිඛිතව දැන්විය යුතුය.

13:7 ආධුනික පොලිස් කොස්තාපල් නිලධරයන් ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා දිවුරුම් දිය යුතුය.

14. පත්වීම ස්ථිර කිරීම :

ඉදුරාම බඳවා ගත් නිලධාරීන් වසර 03 ක පරිවාස කාලය තුළ දී මාසිකව පවත්වනු ලබන ප්‍රගති ගොනුවක් මාස 33 ක් පවත්වා ගෙන යා යුතුය. පරිවාස කාලය අවසානයේ දී එම නිලධරයන්ගේ සේවය පත්කිරීම් බලධාරියා විසින් ස්ථිර කරනු ලැබේ. තවද, පරිවාස කාලය තුළ දී 01 වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත් වන නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨතාව 01 වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ගතවන අමතර කාලය මත කාර්ය පටිපාටික රීති අනුව තීරණය කර, පත්කිරීම් බලධාරියා විසින් සේවය ස්ථිර කරනු ලබයි.

එසේ වුවද ඉදුරාම බඳවා ගනු ලබන, අමතර වසර 03 ක කාලයක් ඇතුළත 01 වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත් වන නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීම හෝ පරිවාස කාලය දීර්ඝ කිරීම සම්බන්ධව පත්කිරීම් බලධාරියා විසින් තීරණය කළහොත් මිස පත්වීම අවසන් කරනු ලැබේ.

15. කාර්යක්ෂමතා කඩඉම :

කාර්යක්ෂමතා කඩඉම ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ. :

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ (සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය) | පොලිස් කොස්තාපල් තනතුරට පත් වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත, ප්‍රායෝගික හා වාචික |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය | පොලිස් සැරයන් තනතුරට පත් වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය | පොලිස් මහසැරයන් තනතුරට පත් වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩ ගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |

16. භාෂා ප්‍රවීණතාව :

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය. |
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |

17. මෙම ගැසට් පත්‍රයේ I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි බලපානු ඇත.

18. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපිලේඛනවල පිටපත් අයදුම්පත්වලට අමුණා එවිය යුතුය. (මුල් ලිපිලේඛන ඉදිරිපත් නොකළ යුතුය.)

(අ) උප්පැන්න සහතිකය ;
(ආ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ;
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික.

19. (අ) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත්අකුරුවලින් ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධරයෙකු වෙත පුද්ගලිකව භාර නොදිය යුතුය.

20. මෙම නිවේදනයෙ හි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින් ම සනාථ නොකරන අයදුම්පත් හා ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි ආකෘතියට පරිබාහිරව යොමු කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර එබඳු අයදුම්කරුවන් හට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

**සටහන.-** පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

ප්‍රියන්ත වීරසූරිය,
*වැඩබලන* පොලිස්පති.

ශ්‍රී ලංකා පොලීසිය

ආධුනික පොලිස් කොස්තාපල් තනතුර
ආදර්ශ අයදුම්පත්‍රය

මෙහි 2 x 2 ½ ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් අමුණා එවිය යුතුය.

01. (i) (අ) සම්පූර්ණ නම (සිංහල/දෙමළ)

.......................................................................................................................
(උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය)

(ආ) මුලකුරු සමඟ නම (සිංහල/දෙමළ)
.......................................................................................................................

(ii) (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

02. ජාතික හැඳුනුම්පත් අංකය : ............................................................ (ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම : ............................................................

04. අයදුම්කරු උපන් ස්ථානය : ............................................................

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .......................... පළාත : ..........................

05. (i) වර්තමාන ලිපිනය (සිංහල/දෙමළ)
........................................................................................................................................................................

(අ) වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් වසම : ............................................................

(ii) ස්ථිර ලිපිනය (සිංහල/දෙමළ) : ............................................................

(අ) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය ............................................................

(ඇ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම ............................................................

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ............................................................

(ඉ) ලිපි හුවමාරු කළ යුතු ලිපිනය ............................................................

(උ) දුරකතන අංකය : නිවස .................................................... ජංගම : ....................................................

(ඌ) විද්‍යුත් තැපැල් ලිපිනය .................................................... වට්ස්ඇප් අංකය : ...............................

06. ජන වර්ගය ............................................................

07. උපන් දිනය ..........................................................
(උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුයි)

වයස : (*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට*)

අවුරුදු : ............................ මාස : ............................ දින : ............................

08. (*අ*) උස :- අඩි : ............................ අඟල් : ............................ (ආ) පපුව : අඟල් : ............................

උස :- සෙන්ටිමීටර් : ............................ පපුව :- සෙන්ටිමීටර් ............................

09. *අධ්‍යාපන සුදුසුකම්* - (සමත් වී ඇති විභාගයන් සඳහන්කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.)

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය : ............................

විභාග අංකය : ............................

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය : ............................

විභාග අංකය : ............................

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| Z Score අගය | |

(*ආ*) හදාරා ඇති/හදාරමින් සිටින උපාධි :

| *උපාධිය* | *විශ්ව විද්‍යාලය* | *උපාධිය හදාරා ඇත්ද/ හදාරමින් සිටීද යන වග* |
|---|---|---|
| | | |
| | | |

10. ලිඛිත පරීක්ෂණය සඳහා සුදුසුකම් ලදහොත් පෙනී සිටින මාධ්‍යය : .....................................

11. විවාහක/අවිවාහක බව : ....................................

12. දැනට ඔබ කරන රැකියාව : ....................................

13. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ, සේවය කර තිබේද? : ....................................

එසේනම් තනතුර සහ නිල අංකය : ....................................

ඔබ තනතුරින් ඉවත් වූ වා නම් ඉවත් වූ හේතු සඳහන් කරන්න :

..............................................................................................................................................................................

14. (අ) ඔබ සන්නද්ධ සේවයක/ සන්නද්ධ ස්වේච්ඡා සේවයක සේවය කරන්නේද? එසේ නම් නිලය හා නිල අංකය : ..................
(අයදුම්පත අදාළ ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.)

(ආ) ඔබ සන්නද්ධ සේවාවක/ සන්නද්ධ ස්වේච්ඡා සේවයක සේවය කර ඇත්ද? එසේ නම් සේවයේ යෙදී සිටිය දී අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. *නැතහොත්* ඔබ සන්නද්ධ සේවාවක සේවය හැර ගොස් හෝ දඬුවම් ලැබ ඇත්නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න :

15. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද?

එසේම යම් වරදක් (අපරාධ වැරදි/ නින්දනීය වැරදි/ දූෂණ වැරදි) සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබූ හෝ දඬුවම් ලැබ හෝ දඬුවම් වශයෙන් රජයේ ගාස්තුවකට යටත් කර හෝ ඇත්ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න.)

16. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් (අපරාධ වැරදි/ නින්දනීය වැරදි/ දූෂණ වැරදි) සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද? *නැතහොත්* කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ රජයේ ගාස්තුවකට යටත් කර ඇත්ද? එසේ නම් විස්තර සඳහන් කරන්න :

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු අසත්‍ය තොරතුරු බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පත්වීම අවලංගු වන බව හා සේවයෙන් පහකිරීමට යටත් වන බව දනිමි.

....................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ....................................

17. ආයතන ප්‍රධානියාගේ සහතිකය (අදාළ නම් පමණි.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................................ මහතා ................................ ........................................................................................ දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

....................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර : ....................................

දිනය : ....................................

06-112/2

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**
**2025 දෙවන අර්ධ වර්ෂය (ජූලි කණ්ඩායම) ආධුනිකයන් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ දිවයින පුරා පිහිටි ජාතික වෘත්තීය පුහුණු ආයතන, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක අනෙක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා 2025 දෙවන අර්ධ වර්ෂය (ජූලි කණ්ඩායම) ආධුනිකයින් බඳවා ගැනීම දැන් ආරම්භ කර ඇත. එම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක NVQ (ජාතික වෘත්තීය සුදුසුකම්) පාඨමාලා හා NVQ නොවන පාඨමාලා, පාඨමාලා කේත අංක සහිතව පහත දක්වා තිබේ. NVQ මට්ටම හා පාඨමාලා කාලය ද සඳහන් කර ඇත.

පාඨමාලා විස්තර දැනගැනීම සහ පාඨමාලා සඳහා අයදුම් කිරීම :

1. පාඨමාලා පිළිබඳ වැඩි විස්තර පහත දක්වන ලද ක්ෂණික දුරකථන අංකයන්ගෙන් / දිස්ත්‍රික් දුරකථන අංකයන් මගින් හා අපගේ Whatsapp දුරකතනය හා සම්බන්ධ වී SMS පණිවිඩ යොමු කිරීමෙන් ලබාගත හැකිය.

2. ඔබ දිස්ත්‍රික්කයට ආසන්නතම වෘත්තීය පුහුණු අධිකාරියේ දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය / ජාතික වෘත්තීය පුහුණු ආයතනයට හෝ ග්‍රාමීය මධ්‍යස්ථානයට ගොස් අයදුම්පත් භාර දිය හැකිය.

3. පහතින් දක්වන ලද වෙබ් පිටුවට ගොස් මාර්ගගත (Online) ක්‍රමවේදය යටතේ ද පාඨමාලා සඳහා අයදුම් කළ හැකිය.

| | | |
|---|---|---|
| පාඨමාලා ආරම්භය | - | 2025 ජූලි 01 |
| වැඩි විස්තර සඳහා - | | |
| දුරකතන අංක (ක්ෂණික) | - | 011-7270270 |
| | | 011-7277888 |
| | - | 070-6767696 (Whatsapp) |
| ඊ-මේල් ලිපිනය | - | cgjp@vtasl.gov.lk |
| වෙබ් ලිපිනය | - | www.vtasl.gov.lk |
| ෆේස්බුක් පිටුව | - | www.facebook.com/vta |

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

4 වන මහල, නිපුණතා පියස,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

**දිස්ත්‍රික් මධ්‍යස්ථාන හා ජාතික වෘත්තීය පුහුණු ආයතන දුරකතන අංක**

| දිස්ත්‍රික් මධ්‍යස්ථාන | | |
|---|---|---|
| 1 | අම්පාර (සිංහල) | 063 – 2223821 / 071 – 1212013 |
| 2 | අම්පාර (දෙමළ) | 067 – 2251155 / 071 – 0318732 |

| දිස්ත්‍රික් මධ්‍යස්ථාන | | |
|---|---|---|
| 3 | අනුරාධපුර | 025 – 2221400 / 071 – 0318745 |
| 4 | බදුල්ල | 057 – 2223043 / 071 – 7272667 |
| 5 | මඩකලපුව | 065 – 2050753 / 071 – 1783705 |
| 6 | කොළඹ | 011 – 2844151 / 071 – 0318736 |
| 7 | ගාල්ල | 091 – 2234540 / 071 – 0318753 |
| 8 | ගම්පහ | 033 – 2294790 / 071 – 1361130 |
| 9 | හම්බන්තොට | 047 – 2241724 / 071 – 0318721 |
| 10 | යාපනය | 021 – 2227949 / 071 – 0318737 |
| 11 | කළුතර | 034 – 2263698 / 071 – 1040026 |
| 12 | මහනුවර | 081 – 2387200 / 071 – 9660268 |
| 13 | කෑගල්ල | 035 – 2282565 / 071 – 8011109 |
| 14 | කිලිනොච්චිය | 021 – 2285686 / 075 – 8024781 |
| 15 | කුරුණෑගල | 037 – 2237436 / 071 – 1038618 |
| 16 | මාතලේ | 066 – 2286683 / 071 – 0318749 |
| 17 | මාතර | 041 – 2235950 / 071 – 0318743 |
| 18 | මොනරාගල | 055 – 2274775 / 071 – 0318731 |
| 19 | මුලතිවු | 021 – 2290097 / 071 – 3956503 |
| 20 | නුවරඑළිය | 052 – 2223216 / 071 – 1213423 |
| 21 | පොළොන්නරුව | 027 – 2245442 / 071 – 1314779 |
| 22 | පුත්තලම | 032 – 2254110 / 071 – 0318747 |
| 23 | රත්නපුර | 045 – 2274699 / 071 – 0318714 |
| 24 | ත්‍රිකුණාමලය | 026 – 2234517 / 071 – 1211536 |
| 25 | වවුනියාව | 024 – 2221617 / 071 – 1212253 |
| 26 | මන්නාරම | 024 – 2221617 / 071 – 1212253 |
| ජාතික වෘත්තිය පුහුණු ආයතන | | |
| 1 | නාරාහේන්පිට | 011 – 2592233 / 071 – 5145255 |
| 2 | රත්මලාන | 011 – 2638850 / 071 – 9476681 |
| 3 | බද්දේගම | 091 – 2293119 / 071 – 0318744 |
| 4 | නියාගම | 091 – 2296445 / 071 – 0796902 |
| 5 | මීරිජ්ජවිල | 047 – 2220501 / 071 – 0318748 |
| 6 | තලල්ල | 041 – 2259331 / 071 – 1213609 |
| 7 | මඩකලපුව | 065 – 2240159 / 071 – 0318729 |
| 8 | ඔරුගොඩවත්ත | 011– 2072850 / 071 – 1315005 |

**ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ :**

- නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ පාඨමාලා හැදෑරීම
- ජාතික වෘත්තිය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම 03 හා 04 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා හා තාක්ෂණ උපාධිය ලබාගැනීමේ අවස්ථාව
- තෝරාගත් පාඨමාලා සඳහා මාසික දීමනාවක්
- සහනදායී මුදලකට ලංගම ප්‍රවේශ පත්‍ර
- වෘත්තිය උපදේශන සේවාව හා වෘත්තිය ඉංග්‍රීසි දැනුම
- ව්‍යවසායකත්ව දැනුම
- ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සහතිකයක්
- මාසික දීමනාවක් සමඟින් වැඩිදුර පුහුණුව
- දේශීය / විදේශීය රැකියා සඳහා යොමු කිරීම
- ස්වයං රැකියා සඳහා යොමුකිරීම
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව පුහුණුව සමඟ අඩු පොලී ණය පහසුකම් සඳහා යොමු කිරීම
- ව්‍යාපාර උපදේශන සේවා
- ක්ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළු මගින් දැනුම යාවත්කාලීන කිරීම
- පාඨමාලා කාලය තුළ නොමිලේ ජීවිත රක්ෂණ ආවරණයක්.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය**
**2025 දෙවන අර්ධ වර්ෂය (ජූලි කණ්ඩායම) සඳහා ආධුනිකයන් බඳවා ගැනීම**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම - ..........................................................................................................
2. ලිපිනය - ...............................................................................................
3. පදිංචිය - ...............................................................................................
    i. ග්‍රාමසේවා වසම - ............................................................................
    ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ..........................................................
    iii. දිස්ත්‍රික්කය - .........................................................................................
4. දුරකතන අංකය - ..........................................................................................

5. උපන් දිනය - ....................................................................

6. ජාතික හැඳුනුම්පත් අංකය - ................................................................

7. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම - ........................................................................................

8. ඔබගේ රුචිකත්වය හා සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා හා මධ්‍යස්ථාන අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| පාඨමාලා කේතය (Course Code) | පාඨමාලාව | NVQ මට්ටම | අදාළ මධ්‍යස්ථානය |
|---|---|---|---|
| | 1. | | 1. |
| | 2. | | 2. |
| | 3. | | 3. |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

දිනය - ....................................

.....................................,
අයදුම්කරුගේ අත්සන.

ඔබගේ අයදුම්පත පාඨමාලාව තෝරාගත් දිස්ත්‍රික්කයේ ආසන්නතම මධ්‍යස්ථානය වෙත ගොස් භාර දිය හැක. පාඨමාලා ආරම්භය 2025 ජූලි මස 01 වැනි දින වේ.

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය
ආධුනිකයන් බඳවා ගැනීම - 2025 දෙවන අර්ධ වර්ෂය (ජූලි කණ්ඩායම)

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| **Agriculture Plantation & Livestock**<br>**කෘෂිකර්ම වැවිලි සහ පශු සම්පත්** | | | | |
| 01 | FAA 4 | National Certificate - Field Assistant (Agriculture)<br>ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) - ජාතික සහතිකය | | 6 |
| 02 | PNDA 4 | National Certificate - Plant Nursery Development Assistant<br>පැළ තවාන් සංවර්ධන සහායක - ජාතික සහතිකය | | 6 |
| **Automobile Repair & Maintenance**<br>**මෝටර්රථ අලුත්වැඩියාව සහ නඩත්තුව** | | | | |
| 03 | DRL | Driver Training (Light Vehicle)<br>රියදුරු (සැහැල්ලු වාහන) | Certificate<br>මාස 4 | |
| 04 | AEM 3<br>AEM 4 | National Certificate - Agricultural Machinery & Equipment Mechanic<br>කෘෂිකර්ම යන්ත්‍රසූත්‍ර සහ උපකරන කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | 18 |
| 05 | AAM 3 | National Certificate - Automobile Air Conditioning Mechanic<br>මෝටර්රථ වායු සමීකරණ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 06 | AAT 4 | National Certificate - Automobile Air conditioning Technician<br>මෝටර් රථ වායුසමීකරණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 07 | AE 3<br>AE 4 | National Certificate - Automobile Electrician<br>මෝටර්රථ විදුලි කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | 12 |
| 08 | AM 3<br>AM 4 | National Certificate - Automobile Mechanic<br>මෝටර්රථ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | 18 |
| 09 | AP 3<br>AP 4 | National Certificate - Automobile Painter<br>මෝටර්රථ පින්තාරු ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 10 | AT 4 | National Certificate - Automobile Technician<br>මෝටර්රථ යාන්ත්‍රික ශිල්පී - ජාතික සහතිකය | | 18 |
| 11 | ATi 3<br>ATi 4 | National Certificate - Automobile Tinker<br>මෝටර්රථ වැද්දුම් ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 12 | MCM 3<br>MCM 4 | National Certificate - Motorcycle Technician<br>යතුරුපැදි කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 13 | OMT 4 | National Certificate - Outboard Motor Technician<br>මෝටර්රථ බෝට්ටු තාක්ෂණ ශිල්පී (පිටත එන්ජින්) - ජාතික සහතිකය | | 12 |
| 14 | TWM 3<br>TWM 4 | National Certificate - Three-Wheeler Mechanic<br>ත්‍රිරෝදරථ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 15 | UP 3 | National Certificate – Upholsterer<br>වාහන කුෂන්කරු - ජාතික සහතිකය | 6 | |
| | | **Building & Construction**<br>**ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | | |
| 16 | ALN 3<br>AL 4-4 | National Certificate - Aluminium Fabricator<br>ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 17 | ALFID 4 | National Certificate - Aluminium Fabrication with Interior Decoration<br>ඇලුමිනියම් පිරිසැකසුම් සහ අභ්‍යන්තර අලංකරන ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 18 | CCM 3<br>CCM 4 | National Certificate - Construction Craftsman (Masonry)<br>ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) - ජාතික සහතිකය | 6 | 12 |
| 19 | CSS 4 | National Certificate - Construction Site Supervisor<br>ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂක - ජාතික සහතිකය | | 12 |
| 20 | DP 4 | National Certificate – Draught sperson<br>සැලසුම් ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 21 | LT 4 | National Certificate - Landscaping Technician<br>උද්‍යාන අලංකරණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| 22 | LDA 3 | National Certificate - Landscaping Development Assistant<br>උද්‍යාන සංවර්ධන සහකාර - ජාතික සහතිකය | 6 | |
| 23 | MST 4 | National Certificate - Multi Skilled Technician<br>බහු කුසලතා තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 24 | PL 3<br>PL 4 | National Certificate – Plumber<br>ජලනල ශිල්පී - ජාතික සහතිකය | 6 | 12 |
| 25 | QS 4 | National Certificate - Quantity Surveying Assistant<br>සහකාර ප්‍රමාණ සමීක්ෂක - ජාතික සහතිකය | | 6 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| | | **Electrical, Electronic & Telecommunication**<br>**විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ** | | |
| 26 | MW 3<br>MW 4 | National Certificate - Electric Motor Winder<br>විදුලි මෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය | 6 | 12 |
| 27 | EAMT 3<br>EAMT 4 | National Certificate - Electrical Appliance Maintenance Technician<br>විදුලි උපකරණ නඩත්තු තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | 6 | 12 |
| 28 | EL 3<br>EL 4 | National Certificate – Electrician<br>විදුලි ශිල්පී - ජාතික සහතිකය | 6 | 12 |
| 29 | EAT 4 | National Certificate - Electronic Appliances Technician<br>විද්‍යුත් උපකරණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 30 | MPR 3 | National Certificate - Mobile Phone Repairer<br>ජංගම දුරකතන අලුත්වැඩියා ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| 31 | PT 4 | National Certificate - Pneumatic Technician<br>වායුපීඩක තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 32 | SPST 4 | National Certificate - Solar Photovoltaic Systems Technician<br>සූරියබල පද්ධති තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| 33 | SSI 3 | National Certificate - Solar Photovoltaic System Installer | 6 | |
| | | **Food Technology**<br>**ආහාර තාක්ෂණය** | | |
| 34 | BAK 4 | National Certificate - Baker/ Commis I (Pastry & Bakery)<br>බේකරි ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| | | **Gem & Jewellery**<br>**මැණික් හා ස්වර්ණාභරණ** | | |
| 35 | JM 4 | National Certificate - Jewellery Maker (Goldsmith)<br>ස්වර්ණාභරණ (අත් නිමැවුම්) - ජාතික සහතිකය | | 12 |
| 36 | JSS 3 | National Certificate - Jewellery Stone Setter<br>ස්වර්ණාභරණ ගල් ඇල්ලීමේ ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| | | **Health and Social Work**<br>**සෞඛ්‍ය හා සමාජ** | | |
| 37 | EGEL 4 | National Certificate - Caregiver (Elder)<br>සත්කාර සේවා වැඩිහිටි - ජාතික සහතිකය | | 6 |
| | | **Hotel & Tourism**<br>**හෝටල් සහ සංචාරක** | | |
| 38 | B 3 | National Certificate – Barista | 6 | |
| 39 | FBA 4 | National Certificate - Food & Beverage Associate<br>ආහාර හා පාන සහකාර - ජාතික සහතිකය | | 6 |
| 40 | GRO 4 | National Certificate - Guest Relation Officer<br>ආගන්තුක සම්බන්ධතා නිලධාරි - ජාතික සහතිකය | | 6 |
| 41 | PC 4 | National Certificate - Professional Cookery<br>වෘත්තීය සූපවේදී - ජාතික සහතිකය | | 6 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 42 | RA 3 | National Certificate - Room Attendant<br>කාමර සේවක - ජාතික සහතිකය | 3 | |
| | | **Information Communication & Multimedia Technology**<br>**තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය** | | |
| 43 | APCGD 4 | Adobe Certified Professional / Graphic Designer | | 6 |
| 44 | CGD 4 | National Certificate - Graphic Designer<br>චිත්‍රක ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| 45 | CHDHI 4 | National Certificate - Graphic Designer (Hearing Impaired)<br>චිත්‍රක ශිල්පී (ශ්‍රවණාබාධිත) - ජාතික සහතිකය | | 6 |
| 46 | CHT 4 | National Certificate - Computer Hardware Technician<br>පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| 47 | CHTCi IT (A+) 4 | National Certificate - Computer Hardware Technician with CISCO IT Essential (A+) | | 6 |
| 48 | ICT 3<br>ICT 4 | National Certificate - Information and Communication Technology Technician<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 49 | MDA 4 | National Certificate - Multimedia Designing Associate<br>බහුමාධ්‍ය නිර්මාණ සහකරු - ජාතික සහතිකය | | 12 |
| 50 | SD 4 | National Certificate - Software Developer<br>මෘදුකාංග සංවර්ධක - ජාතික සහතිකය | | 12 |
| 51 | WD 4 | National Certificate - Web Developer | | 6 |
| | | **Leather & Footwear**<br>**සම් ආශ්‍රිත නිෂ්පාදන** | | |
| 52 | FCM 3 | National Certificate - Footwear Craftsman<br>පාවහන් ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| 53 | LPC 3 | National Certificate - Leather Product Craftsman<br>සම්භාණ්ඩ ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| | | **Metal & Light Engineering**<br>**ලෝහ හා ලුහු ඉංජිනේරු** | | |
| 54 | FM 4 | National Certificate - Fabricator (Metal)<br>ලෝහ පිරිසැකසුම්කරු - ජාතික සහතිකය | | 12 |
| 55 | FG 4 | National Certificate - Fitter (General)<br>වැද්දුම්කරු (සාමාන්‍ය) - ජාතික සහතිකය | | 12 |
| 56 | M-CML 4 | National Certificate - Machanist (CNC Milling & Lathe Operator)<br>යන්ත්‍ර ශිල්පී (CNC Milling & Lathe Operator) - ජාතික සහතිකය | | 6 |
| 57 | M-CM 4 | National Certificate - Machanist (CNC Milling Operator)<br>යන්ත්‍ර ශිල්පී (CNC Milling) - ජාතික සහතිකය | | 6 |
| 58 | M 3<br>M 4 | National Certificate - Machanist<br>යන්ත්‍ර ශිල්පී - ජාතික සහතිකය | 12 | 12 |
| 59 | WE 3<br>WE 4 | National Certificate – Welder<br>පෑස්සුම් ශිල්පී - ජාතික සහතිකය | 6 | 12 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 60 | WE-GATM 4 | National Certificate - Welder (GAS/ARC/TIG/MAG)<br>පෑස්සුම් ශිල්පී (GAS/ARC/TIG/MAG) - ජාතික සහතිකය | | 12 |
| 61 | WE-GAM 4 | National Certificate – Welder (Flux cored arc Welding)<br>පෑස්සුම් ශිල්පී (Flux cored arc Welding) - ජාතික සහතිකය | | 12 |
| | | **Office Management**<br>**කාර්යාල කළමනාකරණය** | | |
| 62 | SEC 4 | National Certificate - Secretary (Secretarial Practice)<br>ලේකම් පරිචය - ජාතික සහතිකය | | 12 |
| | | **Personal & Community Development**<br>**පුද්ගල හා සමාජ** | | |
| 63 | CHC 4 | National Certificate - Child Caregiver<br>ළමා සුරැකුම් - ජාතික සහතිකය | | 6 |
| | | **Printing & Packaging**<br>**මුද්‍රණ සහ ඇසුරුම්** | | |
| 64 | OLMO 3<br>OLMO 4 | National Certificate - Offset Machine Operator<br>ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 6 | 6 |
| | | **Ref & Air-conditioning**<br>**ශීතකරණ හා වායුසමීකරණ** | | |
| 65 | RAM 3 | National Certificate - Refrigeration & Air-conditioning Mechanic<br>ශීතකරණ හා වායුසමීකරණ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | |
| 66 | RAT 4 | National Certificate - Refrigeration & Air-conditioning Technician<br>ශීතකරණ හා වායු තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| | | **Textile & Garment**<br>**රෙදිපිළි හා ඇඟලුම් ශිල්පී** | | |
| 67 | ADT 4 | National Certificate - Apparel Design Technician<br>ඇඟලුම් නිර්මාණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 68 | BA 3 | National Certificate - Batik Artist<br>බතික් නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| 69 | DMT 3<br>DMT 4 | National Certificate - Dress Maker / Tailor<br>ඇඳුම් මැසීම - ජාතික සහතිකය | 6 | 6 |
| 70 | ISMM 3<br>ISMM 4 | National Certificate - Industrial Sewing Machine Mechanic<br>අධිවේගී මහන යන්ත්‍ර කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 71 | PM 4 | National Certificate - Pattern Maker<br>මෝස්තර නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| 72 | PSS 4 | National Certificate - Production Supervisor (Sewing)<br>නිෂ්පාදන සුපරීක්ෂක (මැහුම්) - ජාතික සහතිකය | | 6 |
| 73 | QAS 4 | National Certificate - Quality Assurance Supervisor (Apparel Production)<br>තත්ත්ව සහතික සුපරීක්ෂක (ඇඟලුම් නිෂ්පාදනය) - ජාතික සහතිකය | | 6 |
| 74 | SCR 3 | National Certificate - Screen Printer<br>තිර මුද්‍රණකරු - ජාතික සහතිකය | 6 | |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 75 | TG 3<br>TG 4 | National Certificate - Tailor(Gents)<br>ඇඳුම් මැසීම (පිරිමි) - ජාතික සහතිකය | 6 | 6 |
| 76 | IEO 4 | National Certificate - Industrial Engineering Officer (Work-Study) | | 6 |
| | | **Wood Related**<br>දැව ආශ්‍රිත | | |
| 77 | WCA 3<br>WCA 4 | National Certificate - Wood Carving Artist<br>ලී කැටයම් ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 78 | WCB 3<br>WCB 4 | National Certificate - Wood Craftsman (Building)<br>දැව තාක්ෂණ ශිල්පී (ගොඩනැගිලි) - ජාතික සහතිකය | 6 | 12 |
| 79 | WCBAL 3<br>WCBAL 4 | National Certificate - Wood Craftsman (Building) with relavent Aluminium Modules | 6 | 12 |
| 80 | WCF 3<br>WCF 4 | National Certificate - Wood Craftsman (Furniture)<br>දැව තාක්ෂණ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) - ජාතික සහතිකය | 6 | 12 |
| 81 | WCFAL 3<br>WCFAL 4 | National Certificate - Wood Craftsman (Furniture) with relavent Aluminium Modules | 6 | 12 |

| | | Course Name | NVQ Level 5 |
|---|---|---|---|
| 82 | AT 5 | National Diploma - Automobile Technology<br>මෝටර්රථ තාක්ෂණික ශිල්පී - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 83 | QS 5 | National Diploma - Quantity Surveying<br>ප්‍රමාණ සමීක්ෂක - ජාතික ඩිප්ලෝමාව | 12 |
| 84 | EL 5 | National Diploma - Electrical Technology<br>විදුලි තාක්ෂණ - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 85 | FPT 5 | National Diploma - Fluid Power Technology (Hydraulic & Pneumatic)<br>ද්‍රව බලශක්ති තාක්ෂණ - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 86 | MT 5 | National Diploma - Mechatronics Technology<br>යාන්ත්‍රික ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 87 | ICT 5 | National Diploma - Information and Communication Technology NVQ Level 5<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ජාතික ඩිප්ලෝමාව | 12 |
| 88 | CNC 5 | National Diploma - Computer Numerically Controlled Manufacturing Technology (CNC Technology)<br>CNC තාක්ෂණය - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 89 | WT 5 | National Diploma - Welding Technology<br>පෑස්සුම් තාක්ෂණය - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 90 | RACT 5 | National Diploma - Refrigerator & Air-conditioning Technology<br>ශීතකරණ හා වායු සමීකරණ - ජාතික ඩිප්ලෝමාව | 18 |
| 91 | RET 5 | National Diploma – Renewable Energy Technology<br>පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය - ජාතික ඩිප්ලෝමාව | 18 |

සංශෝධනයයි

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 සඳහා අයදුම්පත් කැඳවන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2025.05.30 දිනැති අංක 2,439 දරන *ගැසට් පත්‍රයෙහි* I කොටස (IIඅ) ඡෙදය අංක 13 යටතේ ඇති,

"එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 - 99 - 00 ආදායම් ශීර්ෂයට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතුය."

යන්න වෙනුවට,

"එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් 2003-99-00 යන දෙපාර්තමේන්තු ශීර්ෂයට බැරවන සේ දෙපාර්තමේන්තුවේ සරප් අංශය වෙත ගෙවා ලබා ගන්නා ලදුපත හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් නමින් පේරාදෙණිය මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 057100179027275 දරන ගිණුමට දිවයිනේ ඕනෑම මහජන බැංකුවකින් මුදල් බැර කිරීමෙන් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතුය. "

යනුවෙන්ද,

*ගැසට්* නිවේදනයෙහි 08 වන ඡේදයෙහි විභාගය සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය

"2025 ජුනි මස 20 වැනි දින "
යන්න වෙනුවට,

"2025 ජුනි මස 30 වැනි දින"
යනුවෙන් ද සංශෝධනය කරමි.

02. එම *ගැසට්* නිවේදනයෙහි සඳහන් අනෙකුත් උපදෙස්වල වෙනසක් සිදු නොවේ.

ආචාර්ය කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල,
අධ්‍යක්ෂ ජනරාල්.

2025 ජුනි මස 11 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13, ගැටඹේ.
පේරාදෙණිය.

06-108/1

---

සංශෝධනයයි

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 සඳහා අයදුම්පත් කැඳවන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2025.05.30 දිනැති අංක 2,439 දරන *ගැසට් පත්‍රයෙහි* I කොටස (IIඅ) ඡෙදය අංක 13 යටතේ ඇති,

"එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2003 - 99 - 00 ආදායම් ශීර්ෂයට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතුය."

යන්න වෙනුවට,

"එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් 2003-99-00 යන දෙපාර්තමේන්තු ශීර්ෂයට බැරවන සේ දෙපාර්තමේන්තුවේ සරප් අංශය වෙත ගෙවා ලබා ගන්නා ලදුපත හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් නමින් පේරාදෙණිය මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 057100179027275 දරන ගිණුමට දිවයිනේ ඕනෑම මහජන බැංකුවකින් මුදල් බැර කිරීමෙන් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතුය."
යනුවෙන් ද,

*ගැසට්* නිවේදනයෙහි 08 වන ඡේදයෙහි විභාගය සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය

"2025 ජූනි මස 20 වැනි දින"
යන්න වෙනුවට,

"2025 ජූනි මස 30 වැනි දින"
යනුවෙන්ද සංශෝධනය කරමි.

02. එම *ගැසට්* නිවේදනයෙහි සඳහන් අනෙකුත් උපදෙස්වල වෙනසක් සිදු නොවේ.

ආචාර්ය කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල,
අධ්‍යක්ෂ ජනරාල්.

2025 ජූනි මස 11 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13, ගැටඹේ.
පේරාදෙණිය.

06-108/2

---

සංශෝධනයයි

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 සඳහා අයදුම්පත් කැඳවන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2025.05.30 දිනැති අංක 2,439 දරන *ගැසට් පත්‍රයෙහි* I කොටස (IIඅ) ඡේදය අංක 09 යටතේ ඇති,

"එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2003 - 99 - 00 ආදායම් ශීර්ෂයට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතුය. "

යන්න වෙනුවට,

"එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් 2003-99-00 යන දෙපාර්තමේන්තු ශීර්ෂයට බැරවන සේ දෙපාර්තමේන්තුවේ සරප් අංශය වෙත ගෙවා ලබා ගන්නා ලදුපත හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් පේරාදෙණිය මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 057100179027275 දරන ගිණුමට දිවයිනේ ඕනෑම මහජන බැංකුවකින් මුදල් බැර කිරීමෙන් ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතුය"

යනුවෙන් ද,

*ගැසට්* නිවේදනයෙහි 08 වන ඡේදයෙහි විභාගය සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය

"2025 ජූනි මස 20 වැනි දින"
යන්න වෙනුවට,

"2025 ජූනි මස 30 වැනි දින"
යනුවෙන් ද සංශෝධනය කරමි.

02. එම *ගැසට්* නිවේදනයෙහි සඳහන් අනෙකුත් උපදෙස්වල වෙනසක් සිදු නොවේ.

ආචාර්ය කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල,
අධ්‍යක්ෂ ජනරාල්.

2025 ජූනි මස 11 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13, ගැටඹේ.
පේරාදෙණිය.

06-109

---

සංශෝධනයයි

**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරි තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025

අංක 2,431 දරන 2025 අප්‍රේල් මස 04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරි තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025 නම් වන විභාග නිවේදනයේ 15.1 හි ලිඛිත විභාගය යටතේ ඇති විභාගය පිළිබඳ විස්තර දැක්වෙන ඡේදයේ විෂය අංක 01 හි විෂය නිර්දේශය, අදාළ *ගැසට්* නිවේදනයේ 12. යටතේ දක්වා ඇති ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වෙත පවතින බලතල ප්‍රකාරව මතු සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

15.

01 අවබෝධය හා සාමාන්‍ය දැනීම - කාලය පැය 02 යි. ලකුණු 100 යි.

1 වන කොටස - අවබෝධය

අර්ථ විග්‍රහය සාරාංශ හා ඡේදයක් වටහා ගැනීමේ හැකියාව තීරණය කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි.

02. එම *ගැසට්* නිවේදනයේ සඳහන් වන අනෙකුත් විධිවිධාන නොවෙනස්ව එලෙසින් ම බලපැවැත්වෙන බව සැලකිය යුතුය.

අයි. වමින්ද පතිරාජ,
ආගමන හා විගමන පාලක ජනරාල් (වැ. බ.)

2025 ජූනි මස 18 වැනි දින,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
සුහුරුපාය,
බත්තරමුල්ල.

06-179

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.